
5 ශ්‍රේණිය
ගෙවත්ත
2 කොටස
ජී.වී.මධූකා අනුරාධා
වික්‍රමසිංහ
බප /මිනු/ නිල්පනාගොඩ
මහ විදුහල
Home Garden

# පාත්ති සකස් කරනු ලබන ආකාරය

බෝගයට සුදුසු පරිදි පස බුරුල් කර ජලය හොඳින් බැස යන පරිදිය.

යල කන්නයේ දී අඟල් 6 ක් පමණ උසින් ද මාස් කන්නයේ දී අඟල් 9 ක් පමණ උසට ද පාත්ති සකසයි.



## පැළ සිටුවිය යුතු පරතරය

එක් එක් බෝගය අනුව වෙනස් වේ.

1.තක්කාලි /මිරිස් → අඩි 1 1/2 (45cm) පමණ

2.බටු → අඩි 2(60cm)

3.බීට්/නෝකෝල් -අඩි 1(30cm)
4.බී ළූණු - අඩි 1/2(15 cm)
5.රතු ළූණු - 10cm
මෙම පරතරය ඇතැම් ප්‍රදේශවල වෙනස් විය හැක.


## ශාකවලට ජලය යොදන ආකාරය


1.කානු පද්ධතියක් මගින් ජලය ගලා යාමට සැලැස්වීම
2.බාල්දි වැනි බඳුන්වලින් රැගෙන ගොස් පැළවලට වත් කිරීම
3.විසිරී යන ආකාරයට ජලය උපකරණයක් මගින් පැළවලට සැපයීම (විසිරී ජල සම්පාදනය )
4.ප්ලාස්ටික් බටයක හෝ දිගු පොලිතීන් උරවල පැළය ආසන්නයේ සිදුරක් විද බිඳුව බිඳුව ජලය ලැබීමට සැලැස්වීම් . (බිඳිති ජල සම්පාදනය )









# විසිරි ජල සම්පාදනය





# බිඳිති ජල සම්පාදනය



## කාබනික පොහොර සකස් කරනු ලබන ආකාරය

සත්ත්ව අපද්‍රව්‍ය හා ශාක ද්‍රව්‍ය දිරාපත් වීමට සැලැස්වීමෙන් කාබනික පොහොර සාදා ගත හැකිය.

1. ගොම පොහොර
2. කුකුළු පොහොර
3. එළු බෙටි පොහොර
4. අශ්ව බෙටි පොහොර(විදේශීය රටවල)

මීට අමතරව ශාක පත්‍ර ද යොදා ගත හැකිය.

1. වැටහිරියා ශාක පත්‍ර
2. සිදුරු
3. කැප්පෙට්ටියා ශාක පත්‍ර


සත්ත්ව පොහොර



ශාක පත්‍ර
වැටමාර
කැප්පෙට්ටියා
පිදුරු

ගෙවත්තට සතුන්ගෙන් වන හානි
වැළැක්වීමට වැට වර්ග දෙකක් භාවිතා
කරයි.එනම්,

1.සාමාන්‍ය පැළ ඉනිවැට



2.විකර්ණ පැළ ඉනිවැට







වැට ඉන්නකට සුදුසු
දඬු වර්ග
මරතෝන්ඩි
වැට එඬරු
වැටහිරියා
ගඟවැරැල්ල
වැට අන්දර වද


බෝග වගාවන්ට හානි සිදු කරන සතුන්
අලියා
මීයා
ගොළුබෙල්ලා
ඉත්තෑවා
ගවයා
වල් ඌරා
දළඹුවා
ගිරවා


බෝග වගාවන්ට හානි සිදු
කරන කෘමි සතුන්
පලතුරු මැස්සා
කව්පි ගුල්ලා
කෙසෙල් අල ගුල්ලා
බෝංචි මැස්සා
පත්‍ර කීඩෑවා
පිටි මකුණා
කෙසෙල් කුඩිත්තා

# සතුන් වගාවන්ට කරන හානි



1.මඤ්ඤොක්කා,බතල වැනි අල වර්ගවලට ඌරා,මීයා වැනි සත්තු හානි කරති.

2.ගොයම් වගාවට කීඩෑවා,පුරුක් පණුවා,පැළ මැක්කා,කූඩිත්තා හානි කරති.



3.වම්බටු,තක්කාලි,ගස්ලබු,බණ්ඩක්කා,අන්නාසි වැනි වගාවන්ට පිටි මකුණා හානි කරයි.

4.පොල් වගාවේ දී  පොල් ගෙඩිවලට කුඩා කාලයේ දී මයිටාවා හානි කරයි.

5.අඹ ගෙඩිවලට පලතුරු මැස්සා හානි කරයි.

6.පතෝල,කරවිල,වැටකොළු,වැනි කරල්වලට කරල් විඳින පණුවා හානි කරයි.

# වගාවන්ට හානි කරන සතුන්ව ආහාර ලෙස ගන්නා සතුන්

1.සර්පයෝ මීයන් ආහාරයට ගනිති.

2.දිමියා කුඩා කෘමීන් ආහාරයට ගනියි.

3.ගෙම්බා,කටුස්සා වැනි සත්තු කුඩා කෘමීන් ආහාරයට ගනිති.

4.බත් කූරා කුඩා කෘමීන් ආහාරයට ගනියි.

5.ඇටිකුකුළා ගොළුබෙල්ලන් ආහාරයට ගනියි.


ගෙවත්තේ දක්නට
ලැබෙන කෘමීන්
මීමැස්සා
සමනලයා
වේයා
පළගැටියා
ගෙමැස්සා
කුහුඹුවා
බත්කූරා
කැරපොත්තා
කුරුමිණියා
කුඩිත්තා
මදුරුවා


ඇතැම් කෘමීන්ගේ පියාපත් පිහිටන්නේ
ඔවුන්ගේ උරස කොටසේ යි.
මකුළුවාට පාද අටක් ඇති
නිසා ඌ කෘමි සතෙක් ලෙස
සලකන්නේ නැත.


කෘමීන්ගෙන් ශාකවලට සිදුවන හානි
1.ළපටි පත්‍ර කා දැමීම .
2.පැළෑටිය විඳ යුෂ උරා බීම
3.ශාකයේ මල් කා දැමීම .
4.ළපටි අංකුර කා දැමීම .
5.ශාකයේ මුල් කා දැමීම .
6.ශාකයේ ගෙඩි හා කරල් සිදුරු කිරීම හා කා දැමීම .